// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2185/61 - 2020 ජූලි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ඩීඑස්එස්/එල්එන්ඩී/03/ඒකිවුයුආර්ජී/26.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2018/එච්ඩබ්ලිව්/100.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 112, බැද්දේවැව ග්‍රාම නිලධාරී වසමේ, විහාරගල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අ.හු.පි. අංක 4 හි අතිරේක අංක 325 හා පත්‍ර අංක 720 හා 2019.06.20 දිනැති පිඹුරේ කැබලි අංක ඊ 4598 හා ඊ 4599 ලෙස පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1730 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස්:

01. **කැබලි අංක ඊ 4598**
ඉඩමේ නම: තුනේයාය; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අංකඃ හ/උව/සූ/ප්‍ර/1044 (වාරි) මත සූරියවැව විහාරගල පදිංචි පටබැඳි පතිරණගේ තිලකරත්න (අ. හු. පි. 4 හි කැබලි අංක ඩී 9710) (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0457.

02. **කැබලි අංක ඊ 4599**
ඉඩමේ නම: තුනේයාය; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (සූරියවැව, විහාරගල පදිංචි පහලගේ උපුල් ධම්මික විසින් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අංකඃ හ/උව/සූ/අ/7791 දරන අවසර පත්‍රය මත වගා කර ඇත. (අ. හු. පි. 4 හි කැබලි අංක ඩී 9746) (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.1273.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.08.13 දින, පූ.භා. 10.00ට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020.08.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
සූරියවැව.

2020 ජූලි මස 17 වන දින,
සූරියවැව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

08-109

1A - G 32569 - 22 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.